# ස්ත්‍රී පුරුෂ භාවය අනුව විශ්වවිද්‍යාල ප්‍රවේශයේ වර්තමාන ස්වරූපය

සී. ඩී. චතුරංග
ආර්ථික විද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය

## ABSTRACT

උසස් අධ්‍යාපන අවස්ථා ස්ත්‍රී පුරුෂ දෙපාර්ශවයටම සාධාරණව හිමිවීම වැදගත්ය. ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල තුළ ස්ත්‍රී පුරුෂ නියෝජනය කෙසේ ද? යන්න අධ්‍යයනය කිරීම මෙහි අරමුණ වේ. මෙහි දී මෙරට පිළිගත් රජයේ විශ්වවිද්‍යාල 15 ක ද්විතීයික දත්ත සංඛ්‍යානමය ශිල්පීයක්‍රම මඟින් විශ්ලේෂණය කර තිබේ.

2008 වර්ෂයේ දී ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල පද්ධතිය තුළ අධ්‍යයනයේ නිරත විද්‍යාර්ථීන් අතරින් පුරුෂයින්ට වඩා 15.46% ක වැඩි ස්ත්‍රී ප්‍රතිශතයක් දක්නට ලැබිණ. දිගු කාලීනව මෙම ලක්ෂණයේ වර්ධනයක් හඳුනාගත හැකිය. මේ සඳහා සමස්ත ජනගහනයේ විශ්වවිද්‍යාල අධ්‍යාපනයේ නිරත අවුරුදු 20 - 24 වයස් කාණ්ඩයේ ස්ත්‍රී පුරුෂ නියෝජනය පැහැදිලි ලෙස බලපා තිබේ. එම වයස් කාණ්ඩය තුළ 2008 වර්ෂයේ දී පුරුෂයින්ට වඩා 0.22% ක් ස්ත්‍රීන් වේ. එසේම වර්තමානයේ දක්නට ලැබෙන මෙම විෂමතාව දැනට වයස අවුරුදු 15 - 19 වයස් කාණ්ඩයේ ජනගහනය වයස්ගත වීමත් සමඟ තරමක් දුරට ඉවත්ව යනු ඇත. ඊට හේතුව එම වයස් කාණ්ඩයේ ජනගහනය තුළ ස්ත්‍රී ප්‍රතිශතයට වඩා වැඩි පිරිමි ප්‍රතිශතයක් නියෝජනය වීමයි. කෙසේවෙතත් මෙම තත්ත්වය කෙරෙහි ජනගහනයේ වයස් ව්‍යුහයට අමතරව වෙනත් සාධක වල බලපෑමක් ද දක්නට ලැබේ. විශේෂයෙන් අධ්‍යයන පාඨමාලාවන් අනුව විද්‍යා හා ඉංජිනේරු විෂයධාරාවන් හදාරණු ලබන සිසුන් අතරින් ස්ත්‍රීන්ට වඩා වැඩි ප්‍රතිශතයක් පුරුෂයින් නියෝජනය කරනු ලබයි. එහි වෙනස පිළිවෙළින් 9.52% හා 65.5%ක් වේ. නමුත් කලා හා නීති  විෂයධාරාවන් හදාරණ සිසුන් අතරින් පුරුෂයින්ට වඩා පිළිවෙළින් 53.92%ක් හා 68.12%ක් ස්ත්‍රීන් නියෝජනය වේ. මෙයින් නිගමනය කළ හැකි වනුයේ අධ්‍යයනයේ නිරත විෂය ධාරාවන්ගේ බලපෑම ද විශ්වවිද්‍යාල ප්‍රවේශය ලබන ස්ත්‍රී පුරුෂ අනුපාතය තීරණය වීම කෙරෙහි දක්නට ලැබෙන බවයි.
විෂය ධාරාවන් අනුව විශ්වවිද්‍යාල ප්‍රවේශයේ දී දක්නට ලැබෙන මෙම වෙනස ඉවත් වන පරිදි අධ්‍යාපන ක්‍රමය සකස් විය යුතු අතරම සමාජය තුළ දක්නට ලැබෙන ස්ත්‍රී පුරුෂ බව අනුව විෂයන් තෝරාගැනීමේ දී දක්නට ලැබෙන ආකල්පමය ප්‍රවණතාවයේ වෙනසක් ඇති කළ යුතු වේ.

මූල පද : ස්ත්‍රී, පුරුෂ, විශ්වවිද්‍යාල, අධ්‍යයනය